පූජාපිටිය ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දින ද, විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට ලද ක්‍රීඩා උපකරණ අයිතම 13 ක වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීම් කළ යුතු වේ. | වටිනාකම් ලද පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ආ) | පරිත්‍යාග ලෙස ලද රු.624,268 ක් වටිනා Weight Plate කට්ටලයක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඇ) | ව්‍යාපෘති 07 කට අදාළව ගෙවිය යුතු රු.771,601 ක මුදලක් ප්‍රාග්ධන ණයහිමියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | 2013 වර්ෂයේ ඉටු කළ යුතු රු.500,000 ක් වටිනාකමින් යුතු කර්මාන්ත 02 ක් ඉටු කිරීමකින් තොරව ණයගැති හා ණයහිමි ලෙස දක්වා තිබුණි. | වර්ෂයට අදාළ කර්මාන්ත අවසන් කර ගෙවීම් කළ යුතු වේ. | මෙම කර්මාන්ත මහා සභාවට ඉදිරිපත් කර, කපා හැරීමට ඉදිරියේ දී කටයුතු කරමි. |

1.3.2 අසම්භාව්‍ය බැරකම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් වන විට සභාව විසින් පවරා ඇති හා සභාවට එරෙහිව පවරා ඇති නඩු 16 ක් සම්බන්ධයෙන් වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | නඩු සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන තුළින් හෙළිදරව් කළ යුතු වේ. | මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් නොකිරීම වරදක් ලෙස පිළිගනිමි. |

1.3.3 නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශන අනුව, ගිණුම් විෂයයන් 07 ක ශේෂ උපයෝගී ලේඛන සමඟ සැසඳීමේ දී, රු.122,600 ක නොසැසඳීමක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කළ යුතු වේ. | උපයෝගී ලේඛන සකස් කිරීමේ දී, සිදු වී ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කරමි. |

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අවුරුදු 05 ඉක්මවා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ එකතුව රු.163,073 ක් වී තිබුණි. | ලැබිය යුතු ශේෂ අයකර ගත යුතු වේ. | කොටසක් අය කර ඇති අතර, ඉතිරි හිඟ ආදායම් අය කර ගැනීමට සැලසුම් සකස් කර ඇත. |

(ආ) ගෙවිය යුතු ගිණුම්

| | | |
| --- | --- | --- |
| අවුරුදු 05 ඉක්මවා තිබුණු ගෙවිය යුතු ශේෂවල එකතුව රු.3,300,522 ක් වී තිබුණි. | ගෙවිය යුතු ශේෂ නිරවුල් කළ යුතු වේ. | සභා අනුමැතීන් හෝ කමිටු වාර්තා ලබා ගැනීමෙන් පසු ගෙවීම් කිරීමට හෝ කපා හැරීමට කටයුතු කරමි. |

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ගිණුම් විෂයයන් 04 කට අදාළ ස්ථාවර වත්කම් ලේඛන, තොග ලේඛන, ශේෂ තහවුරු ලිපි, උප ලේඛන හා ගිවිසුම් යනාදී තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන්, එකතුව රු.48,453,787 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. | ඉඩම් හා ගොඩනැගිලි ස්ථාවර වත්කම් ලේඛනය නිවැරදි කර ඇති අතර, නළ ළං තොග සඳහා මු.රෙ.104(4) පරීක්ෂණයක් හා තොරතුරු දැන ගැනීම සඳහා විශේෂ පරීක්ෂණයක් සිදු කර ඇති බැවින්, එම වාර්තා ලද පසු ශේෂ තහවුරු කිරීම් ඉදිරිපත් කරමි. ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක හිඟ මුදලට අදාළ ශේෂ තහවුරු ලිපි ලද පසු තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. |

1.4 <u>අනුකූල නොවීම</u>

<u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති,රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාව රීති 218 | | ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | ගොඩනැගිලි සමීක්ෂණයක් කළ යුතු වේ. | විගණනය මඟින් පෙන්වා දීමෙන් පසුව, ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කර ඇත. |
| (ආ) | 2016 මාර්තු 17 දිනැති අංක 2016/03 දරන මධ්‍යම පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 10 වගන්තිය | | කඩ කාමර අතුරු බදු දිය නොහැකි වුවත්, පූජාපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 24 ක් අතුරු බදු දී තිබුණි. | චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතු වේ. | අතුරු බදු දී ඇති බව සාක්ෂි සහිතව ඔප්පු වූ අය සඳහා පළාත් පාලන කොමසාරිස්ගේ 2016/3 පරිදි කටයුතු කර ඇත. |
| (ඇ) | 2014 දෙසැම්බර් 29 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | | | |
| | | (i) | ක්ෂේත්‍ර කම්කරු 12 දෙනෙකු බඳවා ගෙන ඉන් 06 දෙනෙකු කාර්යාල කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි. | තනතුරේ ස්වාභාවය අනුව, රාජකාරි පැවරිය යුතු වේ. | 04 දෙනෙකු කාර්යාල රාජකාරී කටයුතු සඳහා යොදවා ඇති අතර, පුරප්පාඩු සම්පූර්ණ වූ පසු කම්කරු නිලධාරීන් පුස්තකාල සඳහා අනුයුක්ත කරමි. |
| | | (ii) | 2014 වර්ෂයේ බඳවා ගත් සේවකයින් දෙදෙනෙකු ස්ථිර කිරීමේ දී, පාසැල් හැර යාමේ සහතිකය පදනම් කර ගෙන තිබුණි. | අධ්‍යාපන සහතික පදනම් කර ගෙන පත්වීම් ස්ථිර කළ යුතු වේ. | අවශ්‍ය 05 ශ්‍රේණිය සමත් බව තහවුරු කර ගැනීමට නොහැකි වූ බැවින්, පාසැල් හැර යාමේ සහතිකය පදනම් කර ගෙන ඇත. |

2. <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,721,181 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,787,258 ක් විය.

2.2 <u>ආදායම් පරිපාලනය</u>

2.2.1 <u>ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2018 ඇස්තමේන්තුගත ආදායම | 2018 බිල් කළ ආදායම | 2018 රැස් කළ ආදායම | 2018 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 3,113,959 | 3,187,984 | 2,523,167 | 2,744,670 | 6,770,000 | 12,484,060 | 8,276,425 | 17,044,620 |
| (ii) | කුලී | 3,957,540 | 2,578,603 | 2,727,587 | 364,976 | 1,473,000 | 1,280,180 | 1,205,740 | 800,262 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,217,100 | 2,449,000 | 2,449,000 | -- | 1,301,000 | 1,411,600 | 1,411,600 | -- |
| (iv) | වෙනත් ආදායම් | 17,221,000 | 17,366,135 | 7,243,607 | 28,642,420 | 29,000,000 | 32,857,590 | 38,963,237 | 15,584,440 |
| | එකතුව | 26,509,594 | 25,581,725 | 14,943,361 | 31,752,066 | 38,544,000 | 48,033,430 | 49,857,002 | 33,429,322 |

### 2.2.2 කුලී

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පූජාපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 26 කින් අය විය යුතු රු.1,825,500 ක මුදලක් හිඟව පැවතුණි. | හිඟ කඩ කුලී ආදායම් රැස් කර ගත යුතු වේ. | පළාත් පාලන කොමසාරිස්ගේ උපදෙස් පරිදි 2019 අප්‍රේල් 09 වන දින මහා සභා තීරණ අංක ඉ:1:3 යටතේ අදාළ මුදල අත් හැරීමට තීරණයක් ගෙන ඇති අතර, අනුමැතිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යවා ඇත. |
| (ii) | අඹතැන්න වෙළඳ සංකීර්ණයේ අංක 04 දරන කඩ කාමරය මඟින් 2001 වර්ෂයේ සිට අය විය යුතු රු.140,840 ක කුලිය 2018 දෙසැම්බර් 31 දින වන විටත් හිඟව පැවතුණි. | හිඟ කඩ කාමර කුලී අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ රු.95,000 ක් අය වී ඇති අතර, ඉතිරි මුදල ගෙවීමට මාස 02 ක සහන කාලයක් ලබා දී ඇත. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.1,221,788 ක් වූ අතර, මුද්දර ගාස්තු රු.27,420,632 ක් විය. | හිඟ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය වර්ධනය කර ගත යුතු වේ. | හිඟ ආදායමින් 2019 වර්ෂයේ රු.4,654,110 ක ආදායමක් රැස් කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ත්‍රීරෝද රථ හැර අනෙකුත් වාහන නවතා තැබීමේ ගාස්තු අය කිරීමේ | ත්‍රීරෝද රථ හැර අනෙකුත් වාහන සම්බන්ධව ගාස්තු | නැවතුම් ස්ථාන හඳුනා ගැනීමට සහ නව අතුරු |

| | | |
|---|---|---|
| ක්‍රමයක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද හඳුන්වා දී නොතිබුණි. | අය කිරීමේ ක්‍රමයක් හඳුන්වා දිය යුතු වේ. | ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීමට කටයුතු ආරම්භ කර ඇත. |

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් දිරන කසළ භාවිතා කර කොම්පෝස්ට් නිෂ්පාදනයට හෝ වෙනත් ප්‍රතිචක්‍රීයකරණ ක්‍රමයක් අනුගමනය කිරීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | කොම්පෝස්ට් නිෂ්පාදනය හෝ වෙනත් ප්‍රතිචක්‍රීයකරණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | කසළ බැහැර කිරීමට හඳුනා ගෙන ඇති එනසල්මඩ ඉඩම අත්පත් කර ගැනීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කරමින් පවතී. |

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2017 අගෝස්තු 14 දිනැති ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අංක NP/SP/SDG/17 දරන චක්‍රලේඛය ප්‍රකාරව, තිරසර සංවර්ධන ඉලක්ක කරා ළඟා වීමට අදාළ වන පරිදි සැලසුම් පිළියෙල කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීමට අදාළ සැලසුම් පිළියෙල කළ යුතු වේ. | 2018 වර්ෂයේ දී, මේ පිළිබඳව විධිමත් පරිදි දැනුවත්ව නොසිටි අතර, 2019 වසරේ අයවැය සකස් කිරීමේ දී, ඒ පිළිබඳව අවධානය යොමුකර සකස් කර ඇත. |

3.2 <u>මානව සම්පත් කළමනාකරණය</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාව තුළ පුරප්පාඩු 24 ක් විය. | පුරප්පාඩු 24 සඳහා සේවකයින් බඳවා ගැනීමේ පරිපාටියට අනුව බඳවා ගත යුතු වේ. | බඳවා ගැනීමට පළාත් පාලන කොමසාරිස් වෙතින් අනුමැතිය ලබා දී ඇත. |

3.3 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බල ප්‍රදේශයේ ප්‍රජා ජල ව්‍යාපෘති 22 ක ජලය සාම්පල් පරීක්ෂාවක් කිරීමකින් තොරව බෙදා හරිමින් පැවතුණි. | ජල සාම්පල් පරීක්ෂාවක් තුළින් ජලය බෙදා හැරීමට කටයුතු කළ යුතු වේ. | ප්‍රජා ජල දෙපාර්තමේන්තුව මඟින් ලබා දෙන ජල පරීක්ෂාවන් පිළිබඳ වාර්තා, එම දෙපාර්තමේන්තුවෙන් ඉදිරියේ දී ලබා ගැනීමට කටයුතු කරමි. |
| (ආ) | සභාව සතු වෙළඳ සංකීර්ණ 03 කට අයත් කඩ කාමර 66 කින් 2001 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා නව කුලී තක්සේරුවක් සිදු නොකර, රු.1,000 ක මාසික ගාස්තුවක් දිගින් දිගටම අය කරමින් පැවතුණි. | කඩ කුලී තක්සේරුවක් තුළින් කඩ කුලී අය කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ කඩ කුලී තක්සේරුව 2018 නොවැම්බර් මස සිට අය කිරීමට කටයුතු කර ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මාරතුගොඩ ගම් සභා ගොඩනැගිල්ල පවතින ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු කිරීමට අවශ්‍ය ලියවිලි සභාව සතුව නොපැවතුණි. | වත්කම්වල නිරවුල් අයිතිය තහවුරු කරන නීත්‍යානුකූල ලියවිලි සභාව සතුව පවත්වා ගත යුතු වේ. | පුස්තකාල ගොඩනැගිල්ල පවතින ස්ථානයට අදාළ නඩුවට අනුව, මිණුම් කිරීමේ දී, නිරවුල් අයිතියක් ඇත. |
| (ආ) | සභාවට අයිති නොමැති භූමිවල ගොඩනැගිලි ඉදිකිරීම නිසා, පවරා තිබූ නඩුව වෙනුවෙන් පසු ගිය ආසන්න වර්ෂ 06 ක කාලය තුළ ගෙවූ රු.67,000 ක නීති වියදම් සහා අරමුදලට වූ පාඩුවක් බව දක්නට ලැබුණි. | වත්කම්වල අයිතිය තහවුරු කර ගනිමින් ඉදිකිරීම් කටයුතු සිදු කිරීම | ඉදිකිරීම් කරන අවස්ථාවේ සභාව විසින් අයිතිය තහවුරු කර ගත යුතු වුව ද, එම කාරණය සිදු වී නොමැත. |
| (ඇ) | අඹතැන්න වෙළඳ සංකීර්ණය පිහිටි ඉඩම සඳහා ප්‍රකාශන ඔප්පුවක් පැවතියත්, විධිමත් ඔප්පුවකින් අයිතිය සනාථ කිරීමට කටයුතු කර නොතිබුණි. | වත්කම්වල අයිතිය විධිමත්ව තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | වසර 17 කට වැඩි කාලයක් අඛණ්ඩව භුක්ති විඳිම තුළ සභාවට භුක්තිය තුළ අයිතිය හිමි වේ. ඒ නිසා, එම අයිතිය අධිකරණය මඟින් ඉදිරියේ දී තහවුරු කර ගැනීමට කටයුතු කර ඇති බව සඳහන් කර ඇත. |

3.4.2 වත්කම්වලින් ලැබිය යුතු ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පූජාපිටිය වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 04 ක් 2001 සිට වසා දමා තිබූ බැවින්, පසුගිය වසර 02 ක සඳහා පමණක් රු.480,000 ක මුදලක් සභාවට අහිමි වී තිබුණි. | ලැබිය යුතු ආදායම් හඳුනා ගනිමින් එම ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයේ කඩ කාමර 02 ක් ටෙන්ඩර් කර ලබා දී ඇත. |

3.4.3 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතු රු.18,055,662 ක් වටිනා වාහන 03 ක් හා යන්ත්‍රෝපකරණ 03 ක් වර්ෂයකට වඩා වැඩි කාලයක සිට නිෂ්ක්‍රීයව හා ඌන උපයෝජිතව පැවතුණි. | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වේ. | තක්සේරු වාර්තා ලද පසු ඉදිරියේ දී, ඒ පිළිබඳව කටයුතු සිදු කරමි. |

3.4.4 වාර්ෂික භාණ්ඩ/ තොග සමීක්ෂණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2013 වර්ෂයට අදාළව සිදු කළ භාණ්ඩ සමීක්ෂණය අනුව, නළ ළිං ගබඩාවේ රු.657,422 ක් වටිනා උපකරණ 33 ක අයිතම 60 ක පැවති ඌනතාවය සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණ වාර්තා නිර්දේශ ක්‍රියාත්මක කළ යුතු වේ. | වාර්තා කඩිනමින් ලබා දෙන ලෙස දැනුම් දී ඇත. |

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් කසළ කළමනාකරණ වැඩසටහන සඳහා එනසල්මඩ ඉඩමෙන් අක්කර 09 රූඩ් 01 ක බිම් ප්‍රමාණයක් මිල දී ගැනීමට රු.400,000 ක මුදලක් 2013 වර්ෂයේ දී ගෙවා තිබූ නමුත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉඩම පවරා ගෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. | සභාවට අයත් වත්කම් නීත්‍යානුකූලව පවරා ගැනීමට සහ ව්‍යාපෘති නියමිත කාලය තුළ ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | තක්සේරු වාර්තා ලද පසු ඉදිරි කටයුතු සිදු කරමි. |